සංශෝධනයයි

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු පර්යේෂණ නිලධාරී හා පර්යේෂණ නිලධාරී තනතුරුවලට පත් කිරීම සඳහා වන තරඟ විභාගය - 2024

2024.08.16 දින පළ කරන ලද අංක 2398 ගැසට් පත්‍රයේ 08-144 යටතේ පළවූ ඉහත සඳහන් තරඟ විභාගය සඳහා වූ නිවේදනයේ අංක 02 ඡේදයේ සඳහන්

“ඔබ මෙම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම් මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කර **2024.09.18** දිනට පෙර” යන්න, “ඔබ මෙම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම් මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කර 2025.01.03 දිනට පෙර” යනුවෙන් සංශෝධනය කරමි.

02. එම ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් උපදෙස්වල වෙනසක් සිදු නොවේ.

ලේකම්,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.

2024 දෙසැම්බර් මස 11 වැනි දින

12-282

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

**කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - කෘෂිකර්ම අංශය**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු පර්යේෂණ නිලධාරි හා පර්යේෂණ නිලධාරි තනතුරුවලට පත් කිරීම සඳහා වන තරඟ විභාගය - 2024

දැනට පුරප්පාඩු වී ඇති පශු පර්යේෂණ නිලධාරි හා පර්යේෂණ නිලධාරි තනතුරුවලට අනුයුක්ත කිරීම සඳහා පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින්ගෙන් තරඟ විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ සුදුසුකම්

1. **පශු පර්යේෂණ නිලධාරි** - ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරියෙකු ලෙස වර්ෂ 2018 සිට 2024 දක්වා කාලය තුළ පත්වීම් ලබා තිබීම, ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධිය පළමු පෙළ හෝ දෙවන පෙළ (ඉහළ) සාමාර්ථයක් සහිත වීම.

2. **පර්යේෂණ නිලධාරි** - ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරියෙකු හෝ සත්ත්ව පාලන නිලධාරියෙකු ලෙස 2018 සිට 2024 දක්වා කාලය තුළ පත්වීම් ලබා තිබීම, සතුටුදායක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ පශු වෛද්‍ය විද්‍යාව/සත්ත්ව පාලන විද්‍යාව/කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධිය පළමු පෙළ හෝ දෙවන පෙළ (ඉහළ) සාමාර්ථයක් සහිත වීම.

- මෙම තනතුරු දෙකම සඳහා පහත සුදුසුකම්ද සපුරා තිබිය යුතුය.

  1. පූර්වාසන්න වසරවල විනයානුකූල දඬුවමකට භාජනය වී නොතිබීම හා විනය ක්‍රියාමාර්ග ආරම්භ කර නොතිබීම.
  2. පූර්වාසන්න වසරවල වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

02. ඔබ මෙම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම් මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කර **2024.09.18 දිනට** පෙර සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ එවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 දක්වා තොරතුරු පළමු පිටුවටත් අනෙකුත් ශීර්ෂ පිළිවෙලින් අනෙක් පිටුවටත් ඇතුළත් වන සේ A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය. නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහාලනු ලබන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු වේ.

03. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිඛිත තරඟ විභාගය පවත්වනු ලබන අතර විභාගය සඳහා අපේක්ෂක-යාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය. අපේක්ෂකයන් විසින් රු. 1000 ක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත හෝ පහත ගිණුම් අංකය වෙත හෝ බැරවන ලෙස දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදල් ගෙවා ලබාගන්නා ලදුපත හෝ ලදුපතෙහි පැහැදිලි පිටපතක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුදල් භාරගනු නොලබන අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකෙරේ.

| | | |
|---|---|---|
| ගිණුම් හිමියාගේ නම | : | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් |
| බැංකුව | : | මහජන බැංකුව, පේරාදෙණිය ශාඛාව |
| ගිණුම් අංකය | : | 057-100179027275 |

04. විභාගය සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කළ පසු අයදුම්කරුවෙකු වෙත ප්‍රවේශපත්‍ර නොලැබුණු අවස්ථාවක දී අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ පිටපත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීමක් කළ යුතුය. සෑම විභාග අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශපත්‍රයෙ හි අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. විභාග පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතුය.

05. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පමණක් මහනුවර නගරයේ දී පවත්වනු ලැබේ.

06. ලිඛිත තරඟ විභාගයේ දී ලබාගන්නා කුසලතාව පදනම් කර බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. ප්‍රතිඵල මත පවතින පුරප්පාඩු අනුව වැඩිම ලකුණු ලබාගන්නා නිලධාරින් කුසලතා අනුපිළිවෙල අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. (විෂය නිර්දේශය ඇමුණුම 02 හි දැක්වේ)

07. තවද පශු පර්යේෂණ නිලධාරියෙකු ලෙස හෝ පර්යේෂණ නිලධාරියෙකු ලෙස උක්ත ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත පත්වීම් ලද පසු නැවත පශු වෛද්‍ය නිලධාරි/සත්ත්ව පාලන නිලධාරි තනතුරු සඳහා පත් කරනු ලැබීමට අවස්ථාවක් නොමැති බව කාරුණිකව දන්වමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභා නියමය පරිදි,

ලේකම්,
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

2024 අගෝස්තු මස 12 වැනි දින.